ලිංගික අපරාධයන් සැහැල්ලුවෙන් තකන ආකල්පයක් සමාජගත වීමම, එවැනි අපරාධ සාමාන්‍යකරණය වීමට හේතුවක් නොවන්නේදැයි Ethics Eye අපි නිරන්තරයෙන් අසමු. එවැනි ආකල්පයන් වුවද තවත් සමාජ ගැටළු වලට මඟපාදන බව නොකිවමනාය.

මෙවැනි ලිංගික අපරාධයන් සැහැල්ලුවෙන් තකන ආකල්ප සමාජගත වීම වැළක්වීම සඳහා වගකීමක්, එවැනි සිදුවීම් වාර්තා කරනා මාධ්‍ය අත ද තිබේ.

ඒ අනුව, බාලවයස් ලිංගික අපරාධ සිදුවීම් දෙකක් දිනමිණ පුවත්පතේ (සැප්තැම්බර් 13, 2023) පුවත් වාර්තාවන් දෙකක් තුළ වාර්තා වී ඇති ආකාරය සලකා බලමු.

* "කොල්ලෙක් එක්ක අමුතු අඩව්වක් ඇල්ලූ ගුරා රිමාන්ඩ්" (ලිංගික අතවරයක් සිදුව ඇති බව අන්තර්ගතයේ දැක්වේ)

* "අනියම් බිරියගේ දියණියට නොහොබිනා වැඩක්කර අවුරුදු 18 ක් හිරේට" (ලිංගික අපරාධයක් සිදුව ඇති බව අන්තර්ගතයේ දැක්වේ)

1) නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් වන බාලවයස් ලිංගික අපරාධයන්, "අමුතු අඩව්වක්" ලෙසින් නැතිනම් "නොහොබිනා වැඩක්" ලෙසින් දැක්වීම ඔස්සේ, මෙහි ඇති සැබෑ බරපතල භාවය සමාජයට සන්නිවේදනය වෙතැයි ඔබ සිතන්නේ ද?

2) ඒ අනුව, දිනමිණ මෙම පුවත් වාර්තාවන් ඔස්සේ කෙතරම් දුරට මාධ්‍ය අත ඇති ආචාර ධාර්මික වගකීම සහ සමාජ වගකීම ඉෂ්ට වී තිබෙන්නේ ද?

